# 5 ශ්‍රේණිය සිංහල

# ගුරු අත් පොතට

# වැඩ පොත - අංක 05

**R❸ W❸**

**නිපුණතා ආවරණය - 2021**



1. ළමා කවි, ගීත කියවා අසන ප්‍රශ්නවලට අවබෝධයෙන් යුතුව නිවැරදි පිළිතුරු ලබා දෙයි.
2. ළමා කතන්දර කියවා අසන ප්‍රශ්නවලට තර්කානුකූල ව අදහස් ඉදිරිපත් කරයි.
3. විද්‍යා ප්‍රබන්ධ කියවා එහි සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගයි.
4. වේදිකා නාට්‍යයක් නරඹා වේදිකා නාට්‍යයක් නරඹා ඒ ඇසුරෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.
5. චිත්‍රපටයක් නරඹා එහි සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගයි.
6. යම් චරිතයකට ආරෝපණය වී අවබෝධයෙන් යුතු ව නිවැරදිව කියවයි. / ලියයි.
7. චිත්‍ර කතා කියවා නිර්මාණශීලී අදහස් ඉදිරිපත් කරයි


**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**

# 5 ශ්‍රේණිය මව්බස (සිංහල)
# $R_3$ $W_3$ ඉගෙනුම් පල

- ළමා කවි, ගීත කියවා අසන ප්‍රශ්නවලට අවබෝධයෙන් යුතුව නිවැරදි පිළිතුරු ලබා දෙයි.
- ළමා කතන්දර කියවා අසන ප්‍රශ්නවලට තර්කානුකූල ව අදහස් ඉදිරිපත් කරයි.
- විද්‍යා ප්‍රබන්ධ කියවා එහි සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගයි.
- වේදිකා නාට්‍යයක් නරඹා වේදිකා නාට්‍යයක් නරඹා ඒ ඇසුරෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.
- චිත්‍රපටයක් නරඹා එහි සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගයි.
- යම් චරිතයකට ආරෝපණය වී අවබෝධයෙන් යුතු ව නිවැරදිව කියවයි. / ලියයි.
- චිත්‍ර කතා කියවා නිර්මාණශීලී අදහස් ඉදිරිපත් කරයි

## ළමා කවි, ගීත.

- පහත සඳහන් ළමා කවි, ගීත කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

**මගේ රට** — පී. බී. අල්විස් පෙරේරා

පෙර දිග ලෝකයේ බබළන මුතු ඇට ය
පණ ඇති මහා සමුදුරු පවුරෙන් වට ය
හෙළ දිවයින මගෙයි මා ඉපදුණ රට ය
ලොව අන් සියලු දිවයින් මේකට යට ය

මහවැලි - කැලණි - වලවේ - කළු යන ගංගා
සමනළ කන්ද මුදුනේ සිට පැන නැංගා
බැවුම් තැනිතලා හෙල් අතරින් රිංගා
මේවා ගලයි මිණි කැට දිය යට හංගා

අගනා දුලබ වන මල් ගොමු ඇත බැද්දේ
තුරු මත කුරුල්ලන්ගේ සුමිහිරි සද්දේ
මීදුම් පටල පෙර වූ නිල් කඳු මැද්දේ
සීතල රිදී දියවැල් පහළට ඇද්දේ

අවුකන - ගල් වෙහෙර ඇත මහ පිළිම තැනූ
සූකිරි වගෙයි පුත්තලමේ මිදුණු ලුණු
සීගිරි ගලේ සිතුවම් ලොව පුදුම වුණු
ආඩම්බරයි ලෝවාමහ පහයෙ කණු

රුහුණේ කුඹුරු සරු සාරයි එක හීය යි
මින්නේරියේ ජනපදයයි වෙල් යාය යි
රජරට පළාතේ පමණක් වැව් සීය යි
මේවා බලන්නට මෙන් ඉර හඳ පාය යි

හරියට නියම කාලය තුළ වහින වැසී
නව තඹ පාට වැල්ලක් හැම තැන ම දිසී
දිවයින මගෙයි මුළු ලෝකය කරන වසී
දණ බිම ඔබා නිතර ම නැමදුමට නිසී

1. පළමු වන කවියෙන් එමගේ රටග හඳුන්වා ඇත්තේ කුමක් ලෙසින් ද?

.......................................................................................................................................

2. ලෝකයේ අන් රටවලට වඩා මගේ රට ඉහළ ය යන අදහස දී ඇති කවි පේළිය ලියන්න.

.......................................................................................................................................

3. ගීතයේ සඳහන් පරිදි මහවැලි, කැලණි, කළු, වලවේ ගංගා ආරම්භ වන කන්ද නම් කරන්න.

.......................................................................................................................................

4. මගේ රටේ නාමය ලොව පුදුම කරවූයේ කුමක් නිසා ද ?

.......................................................................................................................................

5. මගේ රට කෘෂිකාර්මික රටක් යැයි කියවෙන කවිය උපුටා ලියන්න.

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

## ගීතය

අක්කෙ ටිකක් ඉන්නකෝ - ඇවිදින් ඉදගන්නකෝ
පුංචි කතාවක් කියන්න තියෙනවා //

මල්ලි නිකං ඉන්නකෝ - මට යන්නට දෙන්නකෝ
ගෙදර දොරේ වැඩපල මට තියෙනවා //

මල්ලි හරි ම දඟකාරයි - කියන කිසිත් දේ නාසයි
අක්ක හරි ම කටකාරයි - ආදරයක් නැති ගානයි
හෝ . . .

අතන මෙතන සෙල්ලමට ම මුළු දවස ම ගෙවනවා
ඒ මදිවට ගෙදර ඇවිත් මට කරදර කරනවා
අක්ක නිකං කෙක්ක වගෙයි - හොයන්නෙ මගෙ වැරදි ම යි
ඔහොම තරහ ගත්තොතින් - ඉක්මනට ම නාකි වෙයි

මල්ලි නිකං ඉන්නකෝ - මට ඉන්නට දෙන්නකෝ
අක්කෙ ටිකක් ඉන්නකෝ - ඇවිදින් ඉදගන්නකෝ

මල්ලි හරි ම දඟකාරයි - කියන කිසිත් දේ නාසයි
අක්ක හරි ම කටකාරයි - ආදරයක් නැති ගානයි

හෝ . . . .

හිටින්න අම්මා එන තුරු - කරවන්නං හොඳ වැඩක්
ගෙදර දොරේ වැඩ හින්දා - මට ඕවට නෑ ඉඩක්

මම නැහැ බය වෙන්නෙ අක්කෙ - වේවැල ඇත හංගලා
අම්මා ආදරෙයි නෙ මට - මොනව කළත් අක්කලා

අක්කෙ ටිකක් . . .
මල්ලි නිකං . . .

පද රචනය : මර්වින් සේනාරත්න

1. පුංචි කතාවක් කියන්න තිබෙන බව පවසා මල්ලි අක්කාට කරන්නට කියන්නේ කුමක් ද?

..............................................................................................................................

2. අක්කාට මල්ලිගේ කතා අසන්නට වේලාවක් නැත්තේ ඇයි ?

..............................................................................................................................

3. මල්ලී මුළු දවස ම ගෙවන්නේ කුමක් කරමින් ද ?

..............................................................................................................................

4. මල්ලීගෙන් බේරීමට බැරි වූ තැන අක්කා පවසන්නේ කුමක් ද ?

..............................................................................................................................

5. මල්ලි පවසන ආකාරයට තරහා ගත්තෝතින් අක්කාට සිදු වන්නේ කුමක් ද??

..............................................................................................................................

6. මල්ලිගේ දඟකාරකම් ගැන කියවෙන අවස්ථා දෙකක් ලියන්න.

..............................................................................................................................

..............................................................................................................................

## ළමා කතා.

- කියවීම් පොතේ ඇතුළත් ඉතුරු සතේට පාඩම කියවා පිළිතුරු ලියන්න.

1. ඉතුරු වුණ සතේට මුදලාලි දුන්නේ මොනවා ද ?

..............................................................................................................................................

2. දතෙහි රුඳී ඇති තිත්ත රස නැති කර ගැනීමට කුමක් කළේ ද ?

..............................................................................................................................................

3. නංගී උදේ පාන්දරින් නැගිට දුවන්නේ කොහේට ද ?

..............................................................................................................................................

4. වත්ත පහළ වැවී ඇත්තේ කුමන ගසක් ද ?

..............................................................................................................................................

5. මෙම කතාවේ සඳහන් පිරිමි ළමයා පසුතැවෙන්නේ කුමක් නිසා ද ?

..............................................................................................................................................

## විද්‍යා ප්‍රබන්ධ.

- කියවීම් පොතේ ඇතුළත් කුරුළු මිතුරා පාඩමේ ඔබ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න.

# <u>වේදිකා නාට්‍ය</u>

- කියවීම් පොතේ ඇතුළත් පුංචි අපට දැන් තේරෙයි වේදිකා නාට්‍ය කියවා දී ඇති ප්‍රකාශය හරි නම් √ ලකුණ ද, වැරදි නම් x ලකුණ ද යොදන්න.

1. ඉර පායන ආරංචිය ගමට කිවුවේ බකමූණා ය. ( )
2. කුකුළු හාමි වැඩට පලට කැමති ය. ( )
3. මී හාමිලා හත් දෙනෙක් සිටිති. ( )
4. මී හාමිලා කුකුළු හාමිගේ විස්තර අසා තිබුණි. ( )
5. මල් පාත්තිය කුකුළු හාමිගේ නිවස පෙන්වීය. ( )
6. කුකුළු හාමි මී හාමිලාට අකාරු,ක විය. ( )
7. මී හාමිලා වී කොටා ගෙන ඒමට යති. ( )
8. කුකුළු හාමි පිටි කෙටුවේ ය. ( )
9. මී හාමිලා දීසි රැගෙන කැවුම් කන්නට ගියහ. ( )
10. කුකුළු හාමි තනි ව ම කැවුම් කෑවේ ය. ( )

# <u>චිත්‍රපට</u>

- හෝ ගානා පොකුණ සිනමා චිත්‍රපටය නරඹා එහි ඔබ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න.

## චරිතාරෝපිත ව කියවීම හා ලිවීම

- පහත එක් මාතෘකාවක් තෝරාගෙන ඒ තමා යැයි සිතා වාක්‍ය පහක් ගොඩනගා ලියන්න.

උදා : **මම පුවත් පතක් වෙමි**

* කඩදාසි හා තීන්ත යොදාගෙන මම මුද්‍රණ යන්ත්‍රයෙන් උපත ලබමි.
* රටේ සිදු වන වැදගත් සිදුවීම්, වෙනස්කම් හා දැන්වීම් ආදිය මඟින් දැනගත හැකි ය.
* ලොකු කුඩා සැම දෙනාගේ ම දැනුම වර්ධනය සඳහා මම විශාල මෙහෙවරක් ඉටු කරමි.
* රට රටවල තොරතුරු ද මා නිසා සැම දෙනෙකුට ම දැන ගත හැකි ය.
* විවිධ තොරතුරු ලබා දීමට මම ඉතා ප්‍රයෝජනවත් කාර්යයක් ඉටු කරමි.

1. මම ගසක් වෙමි.
2. මම සුළඟක් වෙමි.
3. මම මී මැස්සෙක් වෙමි.
4. මම ගුරුවරියක්/ගුරුවරයෙක් වෙමි.
5. මම පැනක් වෙමි.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

## චිත්‍ර කතා

- පහත චිත්‍ර කතාවේ හිස්තැන් සහිත කොටස සම්පූර්ණ කරන්න.




මේ දොළ පාරෙන් එගොඩ වෙන එක තමයි ගමට යන්න තියෙන කෙටි ම පාර. අපි ඊඳ ණ්ඩෙන් එගොඩ වෙමු.
ඒක හොඳ අදහස. අපි එහෙනම් යමු.


යාළුවේ . . . අර බලන්න. වතුර යට ඉන්නේ කවුද කියලා. අපිත් එක්ක මේ බල පැටව දෙන්නත් යනව ද ? අපේ ගමේ දී මම නවදාවත් එහෙම දෙන්නෙක් දැකලා නෑ.
කෝ . . . කෝ . . . ඒ දෙන්නා අපි දිහා බලන් ඉන්නේ. අපිත් එක්ක යන්න ද දන්නේ නෑ.


මේක පුදුම වැඩක් නේ. මේ ඇහුණා ද? ඇයි ඔය දෙන්නා අපිත් එක්ක එන්නේ අපිට දන්නවා ද.?
උත්තරයක් නැනේ. දැන් අපි මොකද කරන්නේ?


කමක් නෑ. අපි වෙලාව නාස්ති කරන්න ඕන නෑ. අපි දැනටමත් පරක්කුයි. අපි එනකම් යාළුවෝ බලාගෙන ඇති.
ඔව්. ඒක ඇත්ත. අපි එගොඩට ගිහිල්ලම අහමු ඇයි අපිත් එක්ක එන්නේ? කියලා. අපිව දන්නව ද? කියලා
හරි... අපි එගොඩට නම් ආවා. ඒත්... කෝ... මේ අපිත් එක්ක ආව දෙන්නා. වටපිටාවේ කොහේවත් පේන්න නෑනේ?
මේක පුදුම වැඩක් නේ?

• පහත චිත්‍ර කතාවේ දෙබස් ලියා සම්පූර්ණ කරන්න.

